# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

**AAT/134 /2024 (PSC)**

01. ආර්.එම්.සී.එල්.රාජපක්ෂ,
02. පී.ආර්.සී.ජේ.ගම්ලත්,
03. පී.සී.කේ.මුදලිගේ,
04. එච්.ඩී.පී.එන්.කේ.රණතුංග,
05. ජේ.ඒ.සී.ජයකොඩි,
06. ආර්.ඒ.එම්.එම්.එම්.සමරකෝන්,
07. ඩබ්.එස්.එස්.කේ.වෙදගේ,
08. ර්.ඩී.ටී.ලක්මාල්,
09. එස්.එල්.ගොඩමුණවිතාන,
10. එම්.පී.ඒ.ඩී.වික්‍රමනායක,
11. ආර්.ඩබ්.ඩී.බී.රත්නායක,
12. එච්.ආර්.එස්.පී.කුමාරතුංග,
13. කේ.ඩී.ජේ.කරුණාරත්න,
14. කේ.පී.එස්.ඒ.බී.ඇතුල්ගම,
15. ඩබ්.ආර්.ඩී.එම්.ජේ.එස්.කේ.වික්‍රමසිංහ,
16. ඒ.පී.ආර්.ආර්.විජේරත්න,
17. එම්.එම්.පී.ටී.යූ.බී.මල්ලව,
18. එන්.එස්.රූබේරු,
19. එන්.ඩී.ආර්.ඩබ්.ලක්මාලි,
20. ඩබ්.ඒ.එස්.ආසිරි,
21. ඩබ්.පී.සී.එන්.කුමාර,
22. එම්.එල්.ඩබ්.රාධික,
23. ආර්.කේ.ඒ.එන්.රණමුක,
24. පී.වයි.එස්.කුමාර,
25. ඩබ්.එම්.එස්.ජේ.වෙඩිසිංහ,
26. ඩබ්.ඩී.සී.ප්‍රනාන්දු,
27. එස්.ඒ.ජේ.එම්.ගුණතිලක,
28. කේ.පී.ඒ.මදුර,
29. ඒ නිරෝෂන්,
30. අයි.ඩබ්.එල්.සඳරුවන්,

**අභියාචකවරුන්**

**එදිරිව**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව,

**වගඋත්තරකරු**

**දිනය :-2026.05.07**

| | | |
|---|---|---|
| ඉදිරියේ දී :- | විනිසුරු කේ.ටී.චිත්‍රසිරි | (සභාපති) |
| | ජේ.ජේ.රත්නසිරි | (සාමාජික) |
| | එස්.නන්දසේකරන් | (සාමාජික) |

පෙනී සිටීම :- අභියාචකවරුන් වෙනුවෙන් විශ්‍රාමික රාජ්‍ය නිලධාරී තිස්ස ගුණතිලක මහතා,
වගඋත්තරකාර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් සහකාර ලේකම්, ගයත්‍රී කෝසලා මිය.

**-නියෝගය-**

**ජේ.ජේ.රත්නසිරි මැතිතුමා (සාමාජික) පරි.අභි.විනි. අධිකාරය**

අභියාචකවරු 2008 හා 2009 වසර වලදී බන්ධනගාර නියාමකවරු වශයෙන් රාජ්‍ය සේවයට එක්වී ඇත. බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සැරයන් තනතුරු සීමිත තරග විභාගය 2019 වසර සඳහා පැවති විභාගයට මෙම අය පෙනී සිට, ඉන් සමත් වි ඇත. අදාළ විභාග දැන්වීමේ නිවේදනය අනුව රාජ්‍ය භාෂා ප්‍රවීනතාවය හැර අනික් සියළු සුදුසුකම් ඒ අය සපුරා ඇත. පුරප්පාඩු ගණන පිරිමි තනතුරු 61 ක් හා කාන්තා 03 ක් ලෙස සඳහන් වී ඇති අතර, අදාළ විභාගය මඟින් පිරිමි තනතුරු 30ක් හා කාන්තා තනතුරු 02ක් සඳහා 2023.04.12 දින පත්වීම් ලබා දී ඇත. විභාගය සමත් වුවත් රාජ්‍ය භාෂා ප්‍රවීනතාවය ඉල්ලුම්පත්‍ර කැඳවන ලද දිනට සපුරා නොමැති වීම් මත, මෙම අයට පත්වීම් ලබා දී නැත. මේ පිළිබඳව අභියාචකයින් විසින් ඉල්ලීමක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කර ඇති අතර, එම ඉල්ලීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රතික්ෂේප කර ඇත. එම තීරණයෙන් තෘප්තිමත් නොවූ අභියාචකවරු මෙම අධිකාරයට 2024.07.15 දින අභියාචනයක් ඉදිරිපත් කරමින්, ඉල්ලා සිටින්නේ,

***"ඒ අනුව මෙම සියළු කරුණු සැලකීමේ දී කාර්ය පටිපාටික රීති 234 හා 238 අනුව උසස් කිරීම් සඳහා සුදුසුකම් සපුරා ගැනීමට අවශ්‍ය කටයුතු පත්වීම් බලධාරියා විසින් නිසිකලට සිදුකළ යුතු වුවත්, භාෂා ප්‍රවීනතාවය සම්පූර්ණ කිරීමට අවශ්‍ය විධිවිධාන සළසා නොදීමත්, සැරයන් තනතුරට උසස් කිරීමේ තරඟ විභාගය නිසි කලට පැවැත්වීමක් සිදුකර නොමැති බව පෙනී යයි. තරඟ විභාගය කොවිඩ් වසංගතය හේතුවෙන් කල් නොගියේ නම්, රා.ප.ච.01/2014 (VIII) චක්‍රලේඛයේ (පෙ.15) විධිවිධාන අනුව සැරයන් තනතුරට උසස්වීම ශ්‍රේණි උසස්වීමක් බැවින්, අනෙක් රාජ්‍ය භාෂාව නොමැතිව***

*අපහට උසස්වීමට හැකියාව තිබූ බව ද පෙනී යයි. මේ වන විට සුදුසුකම් සළකා බැලූ 2018.04.30න් පසු 18/2020 චක්‍රලේඛයේ විධිවිධාන අනුව අනෙක් රාජ්‍ය භාෂාව සම්පූර්ණ කළ නිලධාරීන් දෙදෙනෙකු උසස් කර ඇති බැවින්, එම චක්‍රලේඛයේම විධිවිධාන අනුව අනෙක් රාජ්‍ය භාෂාව සම්පූර්ණ කළ 01 සිට 16 දක්වා නිලධාරීන් ද 12(1) ව්‍යවස්ථාව අනුව සැරයන් තනතුරට උසස් කළ යුතු බව පෙනී යයි. 10/2020(1) චක්‍රලේඛය (පෙ.14) සම්මුඛ පරීක්ෂණ දිනෙන් පසුව නිකුත් කර ඇති බැවින්, එමගින් 2023.10.16 දින සිට 2024.10.16 දක්වා ලබා දී ඇති සහන කාලය සම්මුඛ පරීක්ෂණ දින වන විට ලබා දී තිබූ සහනයක් ලෙස සලකා හෝ නැතහොත් කොවිඩ් වසංගත තත්ත්වය ඇති නොවී විභාගය හා සම්මුඛ පරීක්ෂණය නියමිත දිනට පැවැත්වූ යැයි සළකා අංක 17 සිට 30 දක්වා නිලධාරීන්ට ද පොදු සහනයක් ලබාදෙමින් අප සියළු දෙනා 2021.11.20 දින සිට සැරයන් තනතුරට උසස් කිරීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමු.”*

මෙම කරුණ සනාථ කිරීම සඳහා ඇමුණුම් රැසක් ඉදිරිපත් කර ඇත. පැ.1 සිට පැ.32 දක්වා ලේඛනද, එයට අමතරව 2025.08.27 දින ඇමුණුම් රැසක් සමඟ නිරීක්ෂණ ඉදිරිපත් කර ඇත. එයට අමතරව විවෘත අධිකරණයේ දී වාචික ප්‍රකාශ මඟින් ද කරුණු පැහැදිලි කර සිටින ලදි.

අදාළ කරුණු පිළිබඳව ප්‍රතිඋත්තර රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ද ඉදිරිපත් කර සිටී. රාජ්‍ය සේවා කොමිෂන් සභාව 2025.11.20, 2026.02.13, සහ 2026.04.06 දින නිරීක්ෂණ ඉදිරිපත් කර ඇත. ඊට අමතරව විවෘත අධිකරණයේ දී වාචික පැහැදිලි කිරීම් ද සිදුකරන ලදි. රාජ්‍ය සේවා කොමිෂන් සභාව ඉදිරිපත් කරන ලද ප්‍රධාන නිරීක්ෂණ කිහිපයක් මෙහිදී විමසා බලන ලදි.

(1) 2025.11.20 දින නිරීක්ෂණ ලිපිය මඟින් ප්‍රධාන ලෙසම පනතේ විධිවිධාන අනුව නියමිත කාලය තුළ අදාළ අභියාචනයන් ඉදිරිපත් නොකිරීම පිළිබඳව විරෝධතාවයක් දක්වා ඇත. රාජ්‍ය සේවා කොමිෂන් සභාව 2023.04.12 දින තම තීරණයන් දක්වා ඇති බවත්, අභියාචකවරු අදාළ අභියාචනයන් සති 04ක් ඇතුළත නොව 2024.07.26 දින

ඉදිරිපත් කර ඇති බවත්, ඒ අනුව නියමිත කාලය තුළ ඉදිරිපත් නොවීම මත ප්‍රතික්ෂේප කරන ලෙස ඉල්ලා සිටී.

මේ පිළිබඳව පැහැදිලිව විමසා බැලීමේ දී පෙනී යන්නේ, අදාළ රාජ්‍ය සේවා කොමිෂන් සභා තීරණය පැ.20 ලෙස සටහන් කර ඇති අතර, එය යොමු කර ඇත්තේ, ලේකම්, අධිකරණ අමාත්‍යාංශයට වන අතර, පිටපත් බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වෙත යවා ඇත. එසේ වුවත් ඉන් පසුව අවස්ථා ගණනක් බන්ධනාගාර කොමසාරිස් ජනරාල් හා අමාත්‍යාංශ ලේකම් හරහා ලිපි හුවමාරු වී ඇත. පැ.24, පැ.25, පැ.26, ලේඛන ඒ සඳහා පෙන්වා දිය හැක. අවසන් තීරණය අභියාචකවරුන් වෙත බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් දැනුම් දී ඇත්තේ, 2024.07.03 දිනය. පැ.28 ලේඛනය අනුව එය පැහැදිලි වේ. එම දැනුම් දීමට අනුව අභියාචකවරු 2024.07.26 දින මෙම අධිකරණය පැමිණ ඇත. ඒ අනුව අදාළ විරෝධතාව පිළි නොගැනීමට මෙම අධිකරණය තීරණය කරමු.

(02) එසේම එම ලිපියේම 02 වන නිරීක්ෂණය ලෙස දක්වා සිටින්නේ, මෙම පත්වීම් ශ්‍රේණි උසස් වීමක් නොවන බවය. ඒ අනුව අදාළ චක්‍රලේඛන විධිවිධාන මේ සඳහා අදාළ නොවන බවය. එසේ වුවත් අභියාචකවරුන් ඉදිරිපත් කර ඇති පැ.5 ලේඛනය අනුව එම ලේඛනය රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් 2019.02.22 දිනැතිව ලේකම්, අධිකරණ අමාත්‍යාංශයට යවා ඇත්තේ, බන්ධනාගාර නියාමක තනතුරට බඳවා ගැනීම පිළිබඳව පටිපාටිය වේ. අදාළ බඳවා ගැනීමේ පටිපාටියේ 10 ඡේදය යටතේ ,

10: ශ්‍රේණි උසස් කිරීම,

10:1 නියාමක තනතුරේ සිට සැරයන් තනතුරට උසස් කිරීම,

10:1.1.1 ජ්‍යෙෂ්ඨත්මය හා කුසලතාව අනුව සැරයන් තනතුරට උසස් කිරීම.

10:1.2 ලිඛිත විභාගය අනුව සැරයන් තනතුරට උසස් කිරීම.

10:1.2:1 සපුරාලිය යුතු සුදුසුකම්

ලෙස සඳහන් කර ඇත. ඒ අනුව මේ අයුරින් උසස් කිරීම් නොවේය යන්න බැහැර කිරීමට සිදුවේ. ඒ අනුව අදාළ චක්‍රලේඛන මේ සඳහා බලපවත්වන බවට මෙම අධිකාරය සෑහීමට පත්වන්නෙමු.

(03) මෙයට අමතරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව 2026.04.06 දින ඉදිරිපත් කරන ලද නිරීක්ෂණයන්ට අනුව SCFR 112/2021 දරණ මූලික අයිතිවාසිකම් නඩුවේ තීන්දුව ඉදිරිපත් කරමින් ඒ පිළිබඳව අවධානය යොමු

කරන ලෙසට දන්වා සිටී. අදාළ කරුණ ග්‍රාම නිලධාරී බඳවා ගැනීම් හා බැඳී පවතින නඩු කටයුත්තකි. මෙම අභියාචකවරුන්ගේ ගැටළුව වන්නේ බඳවා ගැනීම පිළිබඳව නොව තම ශ්‍රේණි උසස්වීමක් සහ රාජ්‍ය භාෂාව නියමිත දිනට සමත් වීම/නිදහස් කිරීම පිළිබඳ ගැටළුවක් වේ. ඒ අනුව මෙම නඩු තීන්දුව මෙම කාරණයකදී වැදගත් වන්නේ, කුමන අයුරින්ද යන්න ගැටළු සහගතයි.

මෙම සියළු කරුණු ගැඹුරින් අධ්‍යයනය කිරීමේ දි පැහැදිලි වන්නේ, අදාළ ඉල්ලුම්පත්‍ර කැඳවන අවස්ථාව වන විට සඳහන් සුදුසුකම් යටතේ පැවති රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය අනුව විභාගයන් සමත්වීම/නිදහස් වී සිටීම යන ගැටළුවයි. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම යටතේ චක්‍රලේඛන 15ක් පමණ වරින් වර නිකුත් වී ඇත. ඒ අනුව රාජ්‍ය සේවකයින්ට සහන සැලසීමද සිදුකර ඇත. මෙම අධිකාරය විසින් ම මෙයට පෙර AAT/152/2022/PSC අභියාචනය යටතේ ඒ පිළිබඳව ඉතාමත් හොඳින් පැහැදිලි කර දී ඇත.

- අදාළ නිලධාරීන් දැනටමත් රාජ්‍ය භාෂාව පිළිබඳව නිපුණතාවයක් ලබාගෙන ඇත.
- අදාළ තරඟ විභාගයෙන් සමත් වී සම්මුඛ පරීක්ෂණ වලින් සුදුසුකම් සපුරා ඇත.
- දැනට පුරප්පාඩු 30 පවත්නා බව අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා සටහන් කර සිටී,
- එසේම රාජකාරී කටයුතු වලදී මෙම පුරප්පාඩු පුරවා නොතිබම ගැටළු සහගත බවද දන්වා සිටී.
- මෙම නිලධාරීන් සඳහා වෙනත් විනය හෝ නුසුදුසුකම්ද වාර්තා ද නැත.
- මෙම නිලධාරීන්ට මෙම තනතුර ලබාදීම තුළින් වෙනත් කිසිවෙකුට හෝ අගතියක් සිදුවන්නේ නැත.
- අභියාචකවරු දන්වා සිටින පරිදි මෙම තත්ත්වයෙන්ම සිටි තවත් නිලධාරීන් 02 ක් සඳහා දැනටමත් පත්වීම් ලබා දී ඇත.

ඉහත සියළු කරුණු කෙරේ අවධානය යොමු කරමින්, මෙම අභියාචකවරු ඉල්ලා සිටින ඉල්ලීම සාධාරණ බව මෙම අධිකාරය සෑහීමට පත්වෙමු. එසේ වුවත් අදාළ තනතුරේ රාජකාරී නොකළ කාලයක් සඳහා හිඟ වැටුප් ගෙවීමට මෙම අධිකාරය එකඟ වන්නේ නැත. ඒ අනුව හිඟ

වැටුප් ගෙවීමකින් තොරව **2021.11.20** දින සිට මෙම අභියාචකවරු බන්ධනාගාර සැරයන් තනතුරට උසස් කිරීම සුදුසු බවට තීරණය කරමු. ඒ අනුව උසස් වීම් ලබා දීමට කටයුතු කරන ලෙස රාජ්‍ය සේවා කොමිෂන් සභාවට සහ අදාළ බලධාරින්ට දන්වා යැවීමට කටයුතු කරන්න.

මෙහි පිටපත් අභියාචක, ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යවන්න.

සංශෝධනයන්ට යටත්ව අභියාචනයට ඉඩදී ඇත.

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි

එස්.නන්දසේකරන්
(සාමාජික)

ලලිතා/-